www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ප්‍රන්සයේ සමාජ ව්‍යාපාර: පසු ගිය දශකයේ දේශපාලන පාඩම්

*දෙවන කොටස*

**The social movements in France: Political lessons from the last 10 years**
**Part 2**

**පීටර් ෂ්වාස් විසිනි**
**2006 ජුනි 15**

*ජර්මනියේ සහ මහා බ්‍රිතාන්‍යයේ සමාජවාදී සමානතා පක්ෂ විසින් අප්‍රේල් 17 සිට 21 දක්වා බර්ලින් නුවර පවත්වන ලද සම්මන්ත්‍රනයක දී ලෝක සමාජවාදී වෙබ් අඩවියේ (ලෝසවෙඅ) ජාත්‍යන්තර කර්තෘ මන්ඩල සාමාජික පීටර් ෂ්වාස් ප්‍රන්සයේ දේශපාලන තත්වය අලලා දේශනයක් පැවැත්වී ය. මේ එහි දෙවන කොටස යි.*

## 2005 වසන්තයේ යුරෝපා සංගම් ජනමත විචාරනය

පූර්ව මහජන ව්‍යාපාර ප්‍රධාන වසයෙන් වෘත්තීය සමිති ස්වරූපයක් ගත් නමුත්, 2005 වසන්තයේ පැවති යුරෝපා සංගමයේ ව්‍යවස්ථාව පිලිබඳ ජනමත විචාරනය අරබයා පැනනැගි උද්ඝෝෂනය, ප්‍රථම වරට පුලුල් දේශපාලන බලමුලුගැන්වීමක ස්වරූපයක් ගත්තේ ය.

යුරෝපා සංගම් ව්‍යවස්ථාවට පක්ෂව සහ විපක්ෂව තර්ක ඉස්මතු කරන ලද ගනන් නැති රැස්වීම් මාලාවකට සිය දහස් ගනන් ප්‍රන්ස ජාතිකයන් සහභාගි වූහ. රූපවාහිනී විවාද මිලියන ගනන් ප්‍රේක්ෂකයන් ආකර්ෂනය කර ගති. රටෙහි මනෝගතිය සුවිශේෂීව වැදගත් පාර්ලිමේන්තු හෝ ජනාධිපති මැතිවරනයකින් ජනනය කරන තත්වයකට වඩවඩාත් සමාන විය. තමන්ගේ ඡන්දය මගින් අනවශ්‍ය සමාජ වර්ධනයකට නැවතීමේ තිත තැබිය හැකි බව බොහෝ ජනයා ඒත්තු ගෙන සිටියහ.

දේශපාලනික රැලිවීම ප්‍රමානයෙන් පෘථුලවත්ම, ආන්තික දක්ෂිනාංශය විසින් බලහත්කාරී ලෙස අතිශය භක්ත්‍යාදරයෙන් ඉදිරියට දමා තිබුනු කාරනා - සංක්‍රමනය සහ විදේශික විරෝධය ආදිය - පසුපසට තල්ලු වී, සමාජ හා දේශපාලනික කාරනා ඉස්මත්තට පැමිනියේ ය. "නැත" යන උද්ඝෝෂනය කේන්ද්‍රගත වූයේ ව්‍යවස්ථාවේ නව ලිබරල් හා ප්‍රජාතන්ත්‍ර විරෝධී ස්වභාවය වටායි. එය දිශාගත කරනු ලැබූයේ "යුරෝපයට" එරෙහිව නොව මහා ව්‍යාපාරිකයේ අවශ්‍යතා නියෝජනය කල ව්‍යවස්ථා කෙටුම්පතේ සමාජ විරෝධී සහ ප්‍රතිගාමී අන්තර්ගතයට එරෙහිව යි. "ඔව්" කඳවුර "ශක්තිමත් ප්‍රන්සයක්" සඳහා ආයාචනය කල අතර "නැත" කඳවුරේ වඩාත් ජනප්‍රිය සටන්පාඨය වූයේ "වෙනස් යුරෝපයක්" යන්නයි.

ජනාධිපති ජැක් චිරැක්, ආන්ඩුවේ පක්ෂ, ප්‍රධාන විරුද්ධ පක්ෂය සහ මාධ්‍ය "ඔව්" කියා ඡන්දයක් ලබා ගැනීමට තමන්ට හැකි සියලු දෑ කල ද, අවසානයේ 55%ක පැහැදිලි බහුතරයකින් ව්‍යවස්ථාව ප්‍රතික්ෂේප කරනු ලැබිනි. කඳවුරු දෙක අතර සාමාන්‍ය බෙදීම රටෙහි සමාජමය බෙදීම්වලට අනුරූප විය. නිල් කරපටි කම්කරුවන්ගෙන් හතරෙන් තුනක් ද, සුදු කරපටි කම්කරුවන්ගෙන් තුනෙන් දෙකක් සහ කුඩා පරිමාන ගොවීන් බහුතරයක් "නැත" කියා ඡන්දයක් දුන්හ; මධ්‍යම සහ ඉහල පන්තිවල කොටස් මූලිකව "ඔව්" යයි ඡන්දය ප්‍රකාශ කලහ.

සමාජවාදී පක්ෂයේ එක් පාර්ශ්වයක්, කොමියුනිස්ට් පක්ෂය සහ ඊනියා "අන්ත වම" ව්‍යවස්ථාව ප්‍රතික්ෂේප කරන ලෙස ආයාචනා කලහ. ඔවුන් එසේ කලේ සමාජවාදී වැඩපිලිවෙලක පදනම මත නොවේ; ඔවුන්ගේ උද්ඝෝෂන අත්‍යන්තයෙන්ම එල්ල කරනු ලැබ තිබුනේ ඊනියා "සාම ලිබරල්වාදයට" විරුද්ධවයි. පහලින් එල්ල කරන බලපෑම් හරහා 1970 ගනන්වල සමාජ ප්‍රතිසංස්කරනවාදය වෙත, පාලක කවයන් යලිත් තල්ලු කල හැකි යයි ද, පවත්නා ධනේශ්වර කොන්දේසිවල රාමුව යටතේ විකල්ප ප්‍රතිපත්තියක් කරා යා හැකි ය යන මිථ්‍යාවට ඔවුහු අනුබල දුන්හ.

මෙම උද්ඝෝෂනයේ අරමුන වූයේ, දක්ෂිනාංශික බලයේ රැඳී සිටීමට අපොහොසත් වුවහොත් යලි වාම ආන්ඩුවක් බලයට ගෙන ඒමට සූදානම් කිරීමයි. උද්ඝෝෂනය තුල දී විවිධාකාර "නැත" ධාරාවන්, එකිනෙකට සමීප වෙමින්, කිසිදු අන්‍යෝන්‍ය විවේචනයකින් වැලකුනාහ.

සමාජවාදී පක්ෂයේ අතිශය දක්ෂිනාංශික නායකයන් ගෙන් එක් අයෙකු වන ලෝරන්ට් ෆේබියස් "නැත" කඳවුරට එකතු වීම කැපී පෙනුනි. ෆේබියස් තම ගුරා වූ ප්‍රංශුවා මිතරොංගේ පොත කරපින්නා ගත් අයෙකි. යුදකාලීන විචි පාලන තන්ත්‍රය යටතේ තම දේශපාලන වෘත්තිය ආරම්භ කල ධනේශ්වර දේශපාලනඥයෙකු වූ මිතරොං, 1960 ගනන්වල ඇල්ජීරියානු යුද්ධයේ උච්ච අවස්ථාවේ දී අභ්‍යන්තර කටයුතු ඇමති ලෙස පත් වූ අතර තවත් "වාමාංශිකයෙකු" ලෙස හුවා දැක්වීමට ප්‍රිය කලේ ය. එම අවධියේ දී කම්කරු පන්තියේ සටන්කාමී ව්‍යාපාරය අපසරනය කිරීමට සහ නිෂ්ක්‍රීය කිරීමට පාලක පන්තියට ඉඩ ලබා දෙමින් ඔහු, සමාජවාදී පක්ෂය ස්ථාපනය කලේ ය.

ජනමත විචාරන උද්ඝෝෂනයේ දී, කම්කරු පන්තිය දේශපාලනික ආවෘත අන්තරයකට තල්ලු කර දැමීම සඳහා විප්ලවවාදී කොමියුනිස්ට් සංගමය (එල්සීආර්) තීරනාත්මක භූමිකාවක් ඉටු කලේ ය. ධනේශ්වර " නැත" කඳවුරට සම්පූර්නයෙන්ම අනුබද්ධ වූ එල්සීආර්, එතැන් පටන් කඳවුරේ තනි තනි පද්ගලයන්, හැමකෙක්ම වැලඳගත් දේශපාලන ව්‍යාපාරයක් තුල එක්සත් කිරීමට මං සෙවී ය.

ජනමත විචාරන කාල සීමාවේ දී එලි දැක්වූ එල්සීආර් ප්‍රකාශන තව දුරටත් කම්කරු පන්තිය සහ ධනේශ්වරය අතර වෙනසක් නොව ඇත්තෙන්ම " ඔව් කඳවුර" සහ "නැත කඳවුර" අතර විභේදනය පමනි. සියල්ල වැලඳගත් ව්‍යාපාරයක් සඳහා සිය ආදර්ශය ලෙස ජාත්‍යන්තර මූල්‍ය ප්‍රාග්ධනය සතුටට පත් කල ආන්ඩුව තනා ජනාධිපති තනතුර ද අත්පත් කර ගත් බ්‍රසීලයේ කම්කරු පක්ෂය සහ යුරෝපා සංගමයේ හිටපු සභාපති රොමානෝ ප්‍රොඩිගේ ආන්ඩුවට මෑත දී සම්බන්ධ වූ ඉතාලියේ යලිත් පැලපදියම් වූ කොමියුනිස්ට්වරු ඇතුලත් වූහ.

## 2005 සරත් සමයේ තරුන කැරලි

2005 ඔක්තෝබරය අවසානයේ සිදු වූ පොලීසියෙන් පලා යාමට තැත් කල තරුනයන් දෙදෙනාගේ මරනය, තදාසන්න කම්කරු පන්තික ප්‍රදේශවල සති ගනනක් පුරා පැවතුනු කැරැල්ලක් මුදා හලේ ය. මෙය පැහැදිලි ලෙස අනාවරනය කලේ ප්‍රන්සයේ සමාජ ආතතීන්ගේ පරිමානයයි. නිරන්තරයෙන් දැඩි විනාශකාරී ස්වරූපයක් අත් කර ගත් කැලඹීම, ආන්තික දිලිඳුභාවයට, තරුන විරැකියාවට, තදාසන්න ප්‍රදේශවල වෙනස්කම් කිරීම්වලට මෙන් ම, අභ්‍යන්තර කටයුතු ඇමති නිකොලස් සාකෝසිගේ නීතිය හා සාමය පිලිබඳ උද්ඝෝෂනයේ වර්ගවාදී හඬට ද, එරෙහි වූ ප්‍රතික්‍රියාවක් විය. විරෝධතාවේ යෙදී සිටි තරුනයන් ඇමතිවරයා විසින් හඳුන්වනු ලැබුවේ වීදිවලින් අතුගාදැමිය යුතු " කුනු කසල" හා "වැදගැම්මකට නැත්තන්" ලෙස ය.

තදාසන්න ප්‍රදේශවල දැරිය නොහැකි කොන්දේසිවලට සහ කැරැල්ල පෙන්නුම් කල විනාශකාරී ස්වභාවයට සෘජුව ම වගකීම දරන්නේ සමාජවාදී සහ කොමියුනිස්ට් පක්ෂවල "නිල වාමාංශය" සහ සුලු ධනේශ්වර වාම කන්ඩායම් ය. මෙම පරිහානිගත දිස්ත්‍රික්ක වසර ගනනාවක් තිස්සේ සමාජවාදී හෝ කොමියුනිස්ට් පක්ෂ නගරාධිපතිවරුන්ගේ පාලනයට නතුව තිබුනා පමනක් නොව, පවත්නා දේශපාලන සංස්ථාපිතයට අභියෝග කිරීම මෙම පක්ෂ විසින් ප්‍රතික්ෂේප කරනු ලැබීම ද, තරුනයන්ගේ අවමංගත වීමට වගකීම දැරීය. ඉදිරිදර්ශනයක් නොමැතිකම නිසා තම කෝපය, එක් අතකින් අර්ථ විරහිත ප්‍රචන්ඩ ක්‍රියාවල ස්වරූපයෙන් පල කල, දුප්පත් ම තරුන කොටස්, ප්‍රතිසංස්කරනවාදීන් සහ ස්ටැලින්වාදීන් විසින් නොතකා හරිනු ලැබ සිටිති.

ආන්ඩුව කැරැල්ලට ප්‍රතිචාර දැක්වූයේ, 1965 දී ඇල්ජීරියානු යුද සමයේ සම්මත කර ගත්තා වූ ද, ඉන් පෙර කිසි විටෙක ප්‍රන්සය තුල භාවිතා කර නොතිබුනා වූ ද, නීතියක් මත පදනම් ව, හදිසි අවස්ථාවක් ප්‍රකාශයට පත් කරමිනි. වෘත්තීය සමිතිවලින් සහ වාමාංශික පක්ෂවලින් මෙම පියවරට කිසිදු විරුද්ධත්වයක් පල නොවී ය. විශේෂයෙන් ම කෙටි කලකට පසුව පැවති පක්ෂයේ ජාතික සම්මේලනයකදී තරුන කැරැල්ල හෙලා දැකීම මගින් කම්කරු අරගලය පක්ෂය (එල්ඕ) රාජ්‍යයට ඇති තම දේශපාලනික සමීපස්ථභාවය ප්‍රදර්ශනය කලේ ය.

සිදුවීම්, කෝපය පුපුරාහැලීමක් ලෙස විස්තර කල යෝජනාවට නියෝජිතයන්ගෙන් සියයට අනූ හතක් ම සහයෝගය පලකල ද, එය තමන්ගේ ම සහෝදර පුරවැසියන්ට එරෙහිව එල්ල වූවක් යයි ප්‍රකාශ කෙරිනි. පොලීසිය සහ ගිනි නිවන හමුදාව අතර වෙනස පවා තරුන පිරිස් නොතකා හලේ යයි එල්ඕ මැසිවිලි නැගී ය. තරුනයන් "තමන්ගේ ම අවශ්‍යතාවන්ට එරෙහි වූ ද, ජන මතය තමන්ට විරුද්ධව පිහිටුවා ලූ ද, කටයුතුවල" නිරත වූහ. මෙම හේතුව නිසා එල්ඕව තරුනයන් කම්කරු පන්තියේ කොටසක්ය යන්න පවා ප්‍රතික්ෂේප කලේ ය. "තරුනයන්ගේ කටයුතු පෙන්නුම් කරන්නේ ඔවුන්ට, මාක්ස්වාදීන් කම්කරු ව්‍යාපාරය වෙන් කොට හඳුනා ගත් ආකාරය පිලිබඳ සවිඥානකත්වයක් පවා නොමැති බවයි."

මූලික සමාජ පිපිරීමක් කෙරෙහි මෙසේ ප්‍රතික්‍රියා කිරීම තුලින් ගැඹුරින්ම සංස්ථිතිකවාදී වූ වෘත්තීය සමිති වටපිටාවක දශක ගනනාවක් පුරා කරවටක් ම ගිලී සිටි මෙම සංවිධානයේ මානසිකත්වය පිලිබඳ බොහෝ දේ අනාවරනය කරයි. තරුනයන් කම්කරු පන්තියට අයත් නොවන බවත් එබැවින් ඔවුන්ට එරෙහිව පොලීසිය මුදා හැරීමට විවෘතව සහයෝගය දිය යුතු බව කියා සිටීම දක්වා ඔවුන් තැබිය යුත්තේ කෙටි පියවරක් පමනි.

මෙම දෘෂ්ටියට එරෙහිව කැරැල්ලේ සමාජ මූලයන් හඳුනා ගත් සුලුතරයේ යෝජනාවකට සහයෝගය දක්වූයේ සියයට තුනක් පමනි. එම යෝජනාවට අනුව නිර්ධන පන්තික තරුන කොටසක් වීදි බට අතර, ඔවුන්ට මාවතක් සම්පාදනය කල හැක්කේ කම්කරු පන්තියේ ප්‍රහාරයකින් පමනි. එහෙත් මෙම ප්‍රහාරය දේශපාලනිකව අර්ථ නොදක්වුනු අතර, තනිකරම වෘත්තීය සමිති භාෂාවට අනුව ඉදිරිපත් කරනු ලැබිනි.

## ‘ප්‍රථම රැකියා ගිවිසුමට’ එරෙහි ව්‍යාපාරය

බොහෝ අංශවලින් ගත්කල ප්‍රන්සයේ "ප්‍රථම රැකියා ගිවිසුමට" (සීපීඊ) එරෙහි ව්‍යාපාරය, ගතවූ දශකයේ සමාජ හා දේශපාලන වර්ධනයේ කූටප්‍රාප්තිය යි. මෙම ව්‍යාපාරය, එයට පූර්වයෙන් තිබූ ඒවාට වඩා පුලුල් හා පරිපූර්න වූ අතර, පැරනි සංවිධානයන්ගෙන් බොහෝ කොට ම ස්වාධීන විය.

විරෝධතාවන්හි හඬ තීරනය කල පාසල් සිසුන් හා විශ්වවිද්‍යාල සිසුන්ගෙන් එහි ප්‍රධාන අංගයන් සමන්විත විය. බොහෝ දෙනා අවුරුදු 20ට අඩු අයයි. 1991 සෝවියට් සංගමය බිඳ වැටෙනවිට මෙලොව එලිය නොදැක සිටි බොහෝ දෙනා, 1995-96 මහා වර්ජන ව්‍යාපාරය සමයේ ලදරුවන් ය.

විසිතුරු මාධ්‍ය අටුවාචන්, මෙම ශිෂ්‍යයන් හඳුන්වාදුන්නේ "වරප්‍රසාදිත තරුනයන්" ලෙස ය. "රස්තියාදුකාරයන්" කැරලිකරුවන් ලෙස ඔවුහු ඔවුන් මූර්තිමත් කල අතර, සමාජයේ දිලිඳු කොටස්වලට එරෙහිව පිහිටුවීමටත් උත්සාහ කෙරිනි. එහෙත් මෙය ප්‍රලාපයකි.

"රස්තියාදුකරුවන්" ලෙස හඳුන්වා දුන්, විරෝධතාකරුවන්ට ද පහර දුන් සංවිධිත මැර කල්ලි අනුපූරක ප්‍රපංචයක් වන අතර ඔවුහු පැහැදිලි ලෙස ම රාජ්‍ය ප්‍රකෝපකාරීන්ගේ භූමිකාව රඟ දක්වූ හ. තව ද, වර්තමාන විශ්වවිද්‍යාල සහ උසස් පාඨශාලා ශිෂ්‍යයෝ, උසස් අධ්‍යාපනය ලැබූ සිසුන්ගේ ප්‍රතිශතය සාපේක්ෂව අඩු වූ 1968ට වඩා පුලුල් සමාජ ස්තරයන් මූර්තිමත් කරති. විරෝධතාවලට සහභාගිවූ සංක්‍රමනික හා කම්කරු පන්තික පවුල්වල දූපුතුන්ගේ ඉහල ප්‍රතිශතය නොසලකා හල නොහැකි විය.

යුරෝපා දේශපාලනයේ නිල භාෂාව තුල සාමාන්‍යයෙන්, සුභ සාධන රාජ්‍යයේ "ප්‍රතිසංස්කරනය" සහ "නව්‍යකරනය" ලෙස විස්තර කරනු ලබන සෑම දෙයට ම එරෙහි වූ, ගැඹුරු විරුද්ධත්වයක් මෙම ව්‍යාපාරය මගින් මතුපිටට ගෙන ආවේ ය. පුලුල් ලෙසත් රුදුරු ලෙසත් ප්‍රතික්ෂේප කරනු ලබන්නාවූ සමාජ මූලයක් සංකේතවත් කරන ප්‍රපංචයක් බවට ප්‍රථම රැකියා ගිවිසුම පත් විය.

විරෝධතාවල පැහැදිලිව ප්‍රත්‍යක්ෂ වූ ප්‍රථම දෙය වූයේ සීපීඊ යන කෙටි යෙදුම සමග භාවිතා කල සීමා රහිත අර්ථදැක්වීම් ය. විවිධ වගන්ති රැගත් අතින් පින්තාරු කල පෝස්ටර ගිනිය නොහැකි ප්‍රමානයක් විය: "කුනු බඳුනේ කොන්ත්‍රත්තුව", "ප්‍රථම ඔක්කාරයේ කොන්ත්‍රාත්තුව", "අගමැති ඩොමිනික් ඩි විලෙපින් මඩිය තර කර ගැනීමට පරෙවියෙක් සොයයි" ආදී වසයෙනි.

පනිවුඩය කිසිදු සැකයකට ඉඩක් නොතැබී ය. විරෝධතාකරුවෝ යුරෝපයේ සමස්ථ දේශපාලන ප්‍රභූ තන්ත්‍රයට බෙහෝ කල් ගතවූ හා අත්‍යාවශ්‍ය යයි සලකන ලද ප්‍රතිපත්තිය - එනම් කම්කරු ජනතාව කිසිදු අයිතිවාසිකමකින් තොරව හෝ ඔවුන්ගේ අභිලාෂයන්ට පටහැනිව පෘථුල ශ්‍රම නම්‍යශීලීත්වයක් හරහා මහ ව්‍යාපාරිකයා විසින් සූරාකනු ලබන සමජාතීය ස්කන්ධයක් බවට පරිවර්තනය කිරීම - ප්‍රතික්ෂේප කලහ. *pre'carite'* (ප්‍රෙකේරිත්) යන පදය නිරන්තරයෙන් භාවිතා කරන ලද අතර එහි අර්ථය වන්නේ අවිනිශ්චිතතාව හෝ අනාරක්ෂිත කොන්දේසි යන්නයි.

බොහෝ මත විමසුම්වලින් තහවුරු කල පරිදි විරෝධතාවන් කෙරෙහි සාමාන්‍ය ජනතාව තුල පැවති සහයෝගය අතිශය ප්‍රබල විය. "ප්‍රෙකේරිත්හි" බලපෑමට ලක් වූ වැඩිහිටි පරම්පරාව පමනක් නොව බොහෝ දෙමව්පියෝ ද තම දරුවන්ගේ අනාගතය පිලිබඳව තැවුලට පත් වෙති. ඊට අමතරව බොහෝ දෙමව්පියෝ 1968 විරෝධතාවල දී තරුනයන් ලෙස ක්‍රියාකාරී වුවන් ය.

ව්‍යාපාරය විසින් ආන්ඩුව විස්මයට පත් කරනු ලැබිනි. පූර්ව සරත් සමයේ තදාසන්න ප්‍රදේශවල පැන නැගි කැරලිවල ප්‍රතිඵලයක් ලෙස අගමැති විලෙපින් " සමාන අවස්ථා නීතිය" පැනවී ය. යුරෝපා කොමිසමේ නිර්දේශ මත අසල්වැසි රටවල ක්‍රියාවට දමා ඇති පියවරයන් මත රැකියාවෙන් නෙරපීමට එරෙහි ආරක්ෂාව, සමහර රැකියාවන් සඳහා සැපිරිය යුතු අවම වයස් සීමාව පහත හෙලීම වැනි කම්කරු අයිතීන් කපා හෙලීම එම නීතියට අඩංගුවේ.

එවැනි පියවරයන්ට ප්‍රතිසංස්කරනවාදී පක්ෂ සහ වෘත්තීය සමිතිවල සහයෝගය ද ලැබිනි. මෙයට බොහෝ සෙයින් සමාන නීතියක් වන, 20 දෙනකුට අඩු සේවක මන්ඩලයක් සහිත ව්‍යාපාරවල සියලු වයස්වල සේවකයන්ට බලපාන නව රැකියා ගිවිසුම (සීඑන්ඊ) වෘත්තීය සමිතිවල කිසිදු විරෝධතාවකින් තොරව පසු ගිය වසරේ බලාත්මක කෙරුනි.

ප්‍රථම රැකියා ගිවිසුමට එරෙහි ව්‍යාපාරයට වෘත්තීය සමිති සහභාගි වුව ද මුල පටන් ම ඔවුන්ගේ එල්ලය වූයේ එහි ගෙල මිරිකා එය පාලනය කොට යටත් කිරීමයි. විරෝධතාවල දී ඔවුන් ඉටු කලේ ද්වීතියික භූමිකාවක් පමනි. වර්ජන සංවිධාන කරනු ලැබුනේ ඔවුන්ගේ බලපෑම් සීමා වන පරිද්දෙනි. එම නිසා මාර්තු 28 දා උමං දුම්රිය කම්කරුවන්ගේ නිල වැඩ වර්ජනයක්

තිබුන ද, උමං දුම්රියෙන් පැරිසියේ ප්‍රධාන විරෝධතාවේ ආරම්භක ස්ථානයට ගමන් කිරීම ඉතා පහසු විය.

ශිෂ්‍ය සම්බන්ධීකරන කමිටුවේ භූමිකාව සිත් ගන්නා සුලු විය. වර්ජනයේ යෙදී සිටි විශ්වවිද්‍යාලවල දී තෝරා පත් කරගත් 300 සිට 450 දක්වා නියෝජිතයන්, සෑම සති අන්තයක ම විවිධ නගරවල දී හමු වූහ. පැය ගනන්, සමහරවිට රාත්‍රිය පුරා ද සාකච්ඡා කල ඔවුහු වෘත්තීය සමිති සහ ඊනියා "අන්ත වම" ද ඇතුලත් දේශපාලන සංවිධානවලට වඩා වාමාංශික යෝජනා සම්මත කලහ. ජෙනරල් ස්ට්‍රයිකයක ඉල්ලීම සමගින් වෘත්තීය සමිති වෙත හැරුනු ඔවුහු, කම්හල්වල කම්කරුවන් වෙත සෘජුව ම ගොස් කතා කරන ලෙස ශිෂ්‍යයන්ගෙන් ඉල්ලා සිටියහ.

ප්‍රථම රැකියා නීතියට සුලු වෙනස්කම් යෝජනා කරමින් මාර්තු අවසානයේ දී ජනාධිපති චිරැක් රූපවාහිනිය ඔස්සේ කතාකලවිට, ශිෂ්‍ය සම්බන්ධීකරන කමිටුව එය එක එල්ලේ ම ප්‍රතික්ෂේප කලහ. "වැටුප් වැඩි කිරීම් හා සුරක්ෂිත රැකියා වැනි කම්කරුවන් තම අරගලය තුල දී ඉදිරිපත් කරනු ලබන සෑම ඉල්ලීමකට ම" සහයෝගය දීමට තීරනය කල එම කමිටුව, "වාහන, බාධක, කම්හල් සහ කාර්යාල වාඩිලා ගැනීම් මගින් කම්කරුවන් හා ඔවුන්ගේ ප්‍රාදේශීය වෘත්තීය සමිති ද, වැඩ බිම් ද, බලමුලුගැන්වීමේ " ක්‍රියාකාරී දිනයක් කැඳවුම් කලේ ය. තව දුරටත් එය ආන්ඩුවට ඉල්ලා අස් වන ලෙස බල කලේ ය.

නිසැකයෙන් ම ශිෂ්‍ය සම්බන්ධීකරන කමිටුව පරමාදර්ශයට නැංවීම වැරදි ය. ප්‍රන්ස ජාතික ශිෂ්‍ය සංගමය (යූඑන්ඊඑෆ්) වැනි නිල ශිෂ්‍ය සංවිධානවල ද විවිධ දේශපාලන සංවිධාන හා අරාජිකවාදීන් ද සම්බන්ධීකාරක කමිටුවේ රැස්වීම් නියෝජනය කලහ. එසේ වුවත්, ශිෂ්‍ය සම්බන්ධීකරන කමිටුවේ වැඩ කටයුතු වනාහි පැරනි සංවිධානවල පාලනය හීන වී යන බවට ද නව දේශපාලනික යොමුවක් සඳහා උද්යෝගී ගවේෂනයක් පවතින බවට ද සංඥාවකි.

## නව විප්ලවවාදී නායකත්වයක් ගොඩ නැගීම

මාගේ හැඳින්වීමේ දී මා දකුනට මත් පෙන්වා දී ඇත්තේ, පසු ගිය දශකයේ ප්‍රන්ස සමාජ ව්‍යාපාරවලින් ගලා එන කේන්ද්‍රීය පාඩම වන්නේ, කම්කරු පන්තිය බංකොලොත් වෘත්තීය සමිති සහ ප්‍රතිසංස්කරනවාදී යන්ත්‍රනයන්ගෙන් බිඳී, ස්වාධීන දේශපාලන ව්‍යාපාරයක් වර්ධනය කර ගැනීමේ අවශ්‍යතාව බවයි.

පූර්ව දශකයට වඩා සෘජු ආකාරයකින්, මෙම කර්තව්‍යය අද ඉස්මත්තට පැමිනේ. වෘත්තීය සමිති, වාමාංශික දේශපාලන පක්ෂ සහ ඒවායේ සුලු ධනේශ්වර රැඩිකල්වාදී අංගයන් (එල්සීආර්, එල්ඕ) කොතරම් දකුනට ගමන් කොට ඇත් දැයි කිවහොත්, හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ විප්ලවීය සමාජවාදී ඉදිරිදර්ශනය සහ දේශපාලන සංස්තාපිතය අතර පවතින්නේ අහසට පොලොව මෙන් දුරස්ත භාවයකි. සුලු ධනේශ්වර "වම්මුන්ගේ" පරිහානිය නව අවධියකට ලඟා වී ඇත. ඔවුහු ධනේශ්වර පාලන යන්ත්‍රනයේ සංරචකයක් බවට පත්ව ඇත.

මෙය ද ජාත්‍යන්තර ප්‍රපංචයකි.

ඉතාලිය තුල දී එල්සීආර්හි සහෝදර සංවිධානය ද ඇතුලුව බොහෝ "වාම" සුලුධනේශ්වර සංවිධාන, රොමානෝ ප්‍රෝඩිගේ මැතිවරන සංවිධානය වන යූනියෝන්හි කොටසක් වන ප්‍රතිසංස්තාපිත කොමියුනිස්ට් පක්ෂය තුලට දිය වී ගොස් ඇත.

ඉතාලි උදාහරනය, ඔවුන්ගේ "නීච ලිබරල්වාදය" ප්‍රතිසංස්කරනය කිරීමේ සැබෑ අර්ථභාරය හෙලිදරව් කරයි. අන් කිසිදු දේශපාලනඥයෙකුට වඩා, පස් වසරක් යුරෝපා සංගමයේ ප්‍රධානත්වය දැරූ ප්‍රෝඩි මූර්තිමත් කරන්නේ, ප්‍රන්ස ජනමත විචාරනයේ දී තීරනාත්මකව ප්‍රතික්ෂේප කෙරුනු යුරෝපා සංගමයේ නව ලිබරල්වාදී ක්‍රියා මාර්ගයයි. යූනියෝන්හි වැදගත් සංරචකයක් වන්නේ නිදහස් වෙලඳපොලේ උද්යෝගිමත් ආරක්ෂකයින් දෙපොලක් වන ජර්මනියේ නිදහස් ප්‍රජාතන්ත්‍රවාදීන් සහ ප්‍රන්සයේ ප්‍රජාතන්ත්‍රවාදය සඳහා සංගමය සමග යුරෝපා සංගමය තුල ඒකාබද්ධව සිටින මාගරිටා පක්ෂය යි. එහෙත් මෙය, ඉතාලියේ සුලු ධනේශ්වර රැඩිකලුන්, ප්‍රෝඩිගේ සංවිධානය තුලට ඒකරාශී වීමෙන් වලක්වන්නේ නැත.

ජර්මනියේ දී, සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය (එස්පීඩී), ක්‍රිස්තියානි ප්‍රජාතන්ත්‍රවාදීන් සමග මහා සභාගයකට ඇතුල් වී තිබේ. එස්පීඩීය, වෘත්තීය සමිතිවල ද සමීප සහයෝගය ඇතිව, සියලු ම පූර්ව සමාජ ජයග්‍රහනයන් විනාශ කිරීමේ කර්තව්‍යය භාරගෙන ඇත. මෙම කොන්දේසි යටතේ එස්පීඩීය සහ ක්‍රිස්තියානි ප්‍රජාතන්ත්‍රවාදීන් අතර වෙනසක් දැකීම සරලව ම අසීරු ය. එස්පීඩීය, ක්‍රිස්තියානි ප්‍රජාතන්ත්‍රවාදීන්ට වඩා යම් ආකාරයකින් වමෙන් සිටින්නේ යයි කියා පෑම පැහැදිලිව ම අසත්‍යයකි. මෙයට ප්‍රතික්‍රියාවක් ලෙස ජර්මනියේ පිහිට වූ "වාමාංශික පක්ෂයට" සියලු ම සුලුධනේශ්වර "වාම" සංවිධාන ඇතුලත් වේ.

වාමාංශික පක්ෂය වනාහි, බටහිර ජර්මනියේ අසංතෘප්ත සමාජ ප්‍රජාතන්ත්‍රවාදීන්ගේ සහ වෘත්තීය සමිති නිලධරයන්ගේ ද නැගෙනහිර ජර්මනියේ පැරනි ස්ටැලින්වාදී ආන්ඩු පක්ෂයේ පතුරක් වන ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී පක්ෂයේ (පීඩීඑස්) ද සංකේතයකි. ඉතාලියේ ප්‍රතිසංස්තාපිත කොමියුනිස්ට් පක්ෂය මෙන් ම ජර්මනියේ වාමාංශික පක්ෂය ද සම්මුති විරහිතව ධනේශ්වර පර්යාය ආරක්ෂා කරයි. එහි ම සන්තාපයට හේතු වෙමින් එය කරලියට පැමිනීමට පෙර ම මෙය පැහැදිලිව දැක ගත හැකි විය. වසර හතරක් පුරා

එස්පීඩීය සහ පීඩීඑස් සන්ධානගතව සිටින බර්ලින් ප්‍රාන්ත ව්‍යවස්ථාදායකය අධ්‍යාපන ප්‍රතිපාදන කප්පාදුව සහ රාජ්‍ය නිවාස අංශය පුද්ගලීකරනය හරහා රට පුරා රාජ්‍ය අංශයේ රැකියා විනාශ කිරීමේ සහ වැටුප් කැපීමේ දී ප්‍රමුඛ ක්‍රියාකලාපයක් ඉෂ්ට කරයි.

බැලූ බැලූ සෑම අතකින් ම පැහැදිලිව එක් දෙයක් දිස්වේ. එනම්, අසන්තෘප්ත ප්‍රතිසංස්කරනවාදීන්, වෘත්තීය සමිති නිලධරයන්, පශ්චාත් ස්ටැලින්වාදීන් සහ සුලු ධනේශ්වර රැඩිකලුන්ගෙන් සමන්විත එවැනි සියල්ල වැලඳ ගත් ව්‍යාපාර, ධනේශ්වර සමාජ අර්බුදයට පිලිතුරක් සම්පාදනය නො කරන බවයි. ඒවා වනාහි එහි අර්බුදයේ උච්ච අවස්ථාවේ දී පවත්නා පර්යාය රැකීමේ යන්ත්‍රනයෝ ය.

ඒ අතර වාරයේ, දක්ෂිනාංශික ධනේශ්වර කවයන්, තමන්ගේ ම දේශපාලන සූදානම් වීම්වල නියැලී සිටිති. ගෝල්වාදී මහජන ව්‍යාපාරයක් සඳහා වන සංගමයේ (යූඑම්පී) අගමැති විලෙපින් සහ අභ්‍යන්තර කටයුතු ඇමති සාකෝසි අතර ගැටුම, සරලව ම අභිලාෂී මිනිසුන් දෙදෙනෙකු අතර පුද්ගලික එදිරිවාදිකමකට වඩා දුර දිග යන එකකි. පාලක පක්ෂය ආඥාදායක පාලන ක්‍රම වර්ධනය කිරීමේ ක්‍රම සොයමින් සිටී. සාකෝසි සම්ප්‍රදායික ගෝල්වාදය සමග දක්ෂිනාංශික තන්ත්‍රයන් ලෙස අංගලක්ෂිත කොටස් එකතු කරයි. - නීතිය හා සාමය පිලිබඳ පුරසාරම්, සංක්‍රමනිකයන්ට එරෙහි කුරිරු පියවර, වාර්ගික හා ආගමික අන්තවාදය පෙලඹවීම - සම්බන්ධ කරයි.

ජාතිකවාදී ආර්ථික හා විදේශ ප්‍රතිපත්තියක් මෙන් ම සංගත ව්‍යාපාර සමග ශක්තිමත් ආඥාදායක රාජ්‍යයක් බද්ධ කරන දේශපාලන මාවතක් වෙනුවෙන් ඔහු පෙනී සිටී. ප්‍රථම රැකියා ගිවිසුමට එරෙහි ව්‍යාපාරය සමයේ වෘත්තීය සමිති පසමිතුරු කරගත් විලෙපින් ට වෙනස්ව ඒවා ද ඇතුලත්කර ගැනීමට උත්සාහ දැරූ සාකෝසි අවසානයේ එහි දී සාර්ථක විය. විරෝධතා ව්‍යාපාරය අවසානයකට ගෙන ආ සම්මුතිය සඳහා ආන්ඩුව සාකච්ඡාවලට එලඹියේ ඔහුගේ නායකත්වය යටතේ ය.

වෘත්තීය සමිති සහ අනෙකුත් සමාජ සංවිධාන, රාජ්‍යය තුල ම අන්තර්ග්‍රහනය කර ගැනීම ට සාකෝසි උත්සාහ ගන්නා අතර, වෘත්තීය සමිති මෙම උපායට කෑදර ලෙස අනුගතව ඇත.

මෙම තතු යටතේ ජාත්‍යන්තර කමිටුවෙහි සහ *ලෝක සමාජවාදී වෙබ් අඩවියේ* වගකීම වන්නේ, කම්කරු පන්තියේ ස්වාධීන දේශපාලන ව්‍යාපාරයක් සහ නව විප්ලවවාදී පක්ෂයක් සඳහා පදනම ගොඩනැගීම යි.

සටන්කාමිත්වය සහ වීදිවල බලපෑම, උපායික සහන සැලසීම සඳහා ආන්ඩුවට බල කරනු ලැබුව ද එයට දේශපාලන යොමුව සහ නායකත්වය පිලිබඳ අති මූලික ගැටලුව සාංසිද්ධිකව විසඳිය නොහැක. මේ සඳහා අවශ්‍ය පූර්ව කොන්දේසිය වන්නේ, දේශපාලනික විඥානය වර්ධනය කොට ඔසවාලීම යි. තම අවශ්‍යතා සමස්ත ධනේශ්වර පර්යාය සමග ම පෑහෙන්නේ නැති බව කම්කරු පන්තිය අවබෝධ කර ගත යුතු ය. ජාතික දේශ සීමාවලින් ඔබ්බට නෙත් විදහා, තම ජාත්‍යන්තර පන්ති සහෝදර සහෝදරියන් සමග එක්සත් වීමටත් ඔවුන් උගත යුතු ය. ධනේශ්වර පක්ෂවලින් ද ඒවායේ ප්‍රාථමික හා ද්විතීක ඒජන්තයන්ගෙන් ද ස්වාධීනව ඔවුන් සංවිධානය කල යුතු ය.

*ලෝක සමාජවාදී වෙබ් අඩවියේ* උත්සාහයෙහි හරි මැද පවතින්නේ දේශපාලනික අධ්‍යාපනය පිලිබඳ මෙම කටයුතු ය. දේශපාලනික කර්තව්‍යයන් වටහා ගැනීමට උදව්වන බහුවිධ දේශපාලන විශ්ලේෂනයේ හා ඇගයීමේ අත්දැකීම් සම්භාරයක් පසු ගිය දශකය තුල අප ප්‍රන්සයේ ඉටු කල වැඩ කටයුතු - අපගේ පක්ෂ ප්‍රකාශනවල ද 1998 සිට *ලෝසවෙඅ* තුල ද ලිපි සිය ගනනින් පල වී ඇත - නියෝජනය කරයි. ප්‍රන්සය තුල ජාත්‍යන්තර කමිටුවේ ශාඛාවක් ගොඩනැගිය යුත්තේ මෙම පදනම මතයි.

**සමාප්තයි.**

© www.wsws.org